**ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන 2013**

**-----------------------------------------------------**

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනේ (ජා.කෘ.සං.වැ.) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘ.සං.ජා.අ.) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) අතර 2010 පෙබරවාරි 23 දින එළඹි අංක 797- එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවෙහි, 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සම්පාදනය සහ කාලපරිච්ඡේදය**

**--------------------------------------------------------------------------- -------------------**

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනේ මූල්‍ය ගිවිසුම අනුව, වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම ශ්‍රී ලංකා මහබැංකුව සතු වන අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම දරන නියෝජිතායතනද වේ. එසේ වුවත්, කෘ.සං.ජා.අරමුදලේ පශ්චාත් මධ්‍යකාලීන සමාලෝචන කමිටුව මඟින් 2013 ජනවාරි මාසයේ දී කරන ලද නිර්දේශයන්ට අනුව, 2013 මැයි සිට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ප්‍රධාන වැඩසටහන් නියෝජිතායතනය වන අතර දැනට ක්‍රියාත්මකව පවතින දිවිනැගුම වැඩසටහන සමඟ ඒකාබද්ධව වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ සමස්ත වගකීමද එයට ඇතුළත් වේ. ක්ෂුද්‍ර මූල්‍ය උපසංරචකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ශ්‍රී ලංකා මහ බැංකුව වේ. වැඩසටහනෙහි අරමුණු වනුයේ, ඉඩම් නොමැති සහ කුඩා ගොවීන්ට සහය වීම. විශේෂයෙන්ම තරුණ පිරිස් උදෙසා (අ) වෙළඳපල දාම සංවර්ධනය සහ බැඳීම් සංරචකය සඳහා සහභාගීවීම හරහා ගොවිපලේදී අයකරන මිල වැඩි දියුණු කිරීම තුළින් ඔවුන්ගේ ආදායම් ඉහල නැංවීම, ගොවිපල නිෂ්පාදන හැකියාව සහ පිරිසැකසුම් කළ ගොවිපල නිෂ්පාදන සඳහා අගයක් එකතු කිරීම සහ (ආ) ඉඩම් නොමැති සහ තරුණ පිරිස් සඳහා මූල්‍යාධාර සහ පුහුණුවීම් සැපයීම තුළින් ඔවුන්ට දියුණු කළ සහ වැඩිකළ රැකියා අවස්ථා බිහි කිරීම වේ. මූල්‍ය ගිවිසුම අනුව වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 32.9 ක් වන අතර ඉන් එක්සත් ජනපද ඩොලර් මිලියන 25 ක් මූල්‍යනය කිරීමට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘ.සං.ජා.අ.) එකඟ වී ඇති අතර එක්සත් ජනපද ඩොලර් මිලියන 1 ක් ශ්‍රී ලංකා රජයද සහ ඉතිරි එක්සත් ඩොලර් මිලියන 6.9 පෞද්ගලික සමාගම්, නිෂ්පාදකයන්, ප්‍රජා මූල සංවිධාන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මූලයනය කිරිමට එකඟ වී ඇත. ව්‍යාපෘතියෙහි කටයුතු 2011 පෙබරවාරි 01 දින ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් මාසය වන විට අවසන් වීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරනයේ වගකීම**

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනිම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

**----------------------------------------------------**

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂකයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක්

පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම් වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යාන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතිය කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ වැඩසටහනෙහි මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල්වලින් වැඩසටහන වෙනුවෙන් වූ වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩසටහනෙහි ප්‍රගතිය, වැඩසටහනෙහි මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනිම් ආදිය දැක්වීම පිණිස අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනිම් මූල්‍ය ගිවිසුමේ නියමකර ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ වැඩසටහනෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක සහ අවසාන ශේෂයන්, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌණපූර්ණයන් වැඩසටහන මගින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැං) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 3. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයෙහි දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රීම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුම දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි ප්‍රතිපූර්ණ සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණව විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම රු.91,672,955 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ වියදම රු.56,698,642 ක් විය. 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.156,047,049 ක් විය. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ වැඩසටහනේ වියදම පිළිබඳ සාරාංශයක් සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු . | රු . |
| ලී බඩු සහ උපකරණ | 446,450 | 298,550 | 1,849,634 |
| තාක්ෂණික උපදෙස් සහ | | | |

| | | | |
|---|---|---|---|
| අධ්‍යයන | - | 640,408 | 1,017,410 |
| පුහුණු සහ වැඩමුළු | 615,855 | 1,434,556 | 2,273,322 |
| ක්ෂුද්‍ර මූල්‍ය සහ තරුණ | | | |
| පුහුණුව | 83,394,943 | 40,129,683 | 123,765,784 |
| වැටුප් සහ දීමනා | 6,192,991 | 14,044,866 | 25,942,294 |
| මෙහෙයුම් හා නඩත්තු | 1,022,716 | 150,579 | 1,198,605 |
| | -------------- | ------------- | ---------------- |
| එකතුව | 91,672,955 | 56,698,642 | 156,047,049 |
| | =========== | ========= | =========== |

**4.2 අග්‍රීම අරමුදල් ගිණුම - කෘ.සං.ජා.අ.**

-------------------------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබූ අග්‍රීම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සාරාංශයක් පහත දැක්වේ.

| | එ.ජ.ඩො | රු : |
|---|---|---|
| | -------------- | -------------- |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 2,441,853 | 310,508,039 |
| එකතු කළා : | | |
| වර්ෂය තුළ ලැබීම් | 42,056 | 5,359,490 |
| විදේශ විනිමය වාසි | - | 6,822,724 |
| | ------------------- | ---------------- |
| | 2,483,909 | 322,690,253 |
| අඩු කළා : | | |
| ආපසු ගැනීම් | 1,032,370 | 132,897,183 |
| 2013 දෙසැම්බර් 31 දිබට ශේෂය | 1,451,539 | 189,793,070 |

**5 විගණන නිරීක්ෂණ**

----------------------

**5.1 විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**

---------------------------------------------------------- ---

2014 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණද, වැඩසටහනේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2014 සැප්තැම්බර් 30 දිනදීය

5.2 **මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

-------------------------------------------

**5.2.1 අරමුදල් උපයෝජනය**

------------------------------------

අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය තුළ දී අරමුදල් උපයෝජනයට අදාළ ඇතැම් වැදගත් සංඛ්‍යා ලේඛන සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ තථ්‍ය උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | වාර්ෂික අයවැය මඟින් 2013 වර්ෂය සඳහා වෙන්කළ මුදල | වාර්ෂික අයවැය මඟින් 2013 වර්ෂය සඳහා වෙන්කළ මුදල | සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කරන ලද මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජිත මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු.(මි.) | රු:(මි) | - එ.ජ.ඩො.(මි) | රු:(මි) | රු:(මිලි.) | එ.ජ.ඩො.(මි.) |
| **කෘ.සං.ජා.අ.** | **25.00** | **3,268.75** | | | | | |
| **පෞද්ගලික සමාගම්** | **5.25** | **686.44** | | | | | |
| **ප්‍රජා මූල සංවිධාන** | **0.76** | **99.37** | **400** | **0.71** | **91.67** | **1.12** | **146.04** |
| **සහභාගිත්ව මූල්‍ය ආයතන** | **0.39** | **50.99** | | | | | |
| **නිෂ්පාදකයන්** | **0.57** | **74.53** | | | | | |
| **ශ්‍රී.ලං.රජය** | **0.99** | **129.44** | **20** | **-** | **-** | **-** | **10.01** |
| **එකතුව** | **32.96** | **4,309.52** | **420** | **071** | **91.67** | **1.12** | **156.05** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්චිත වැඩසටහන් කාලපරිච්ඡේදය තුළදී වැඩසටහනේ අරමුණු ඉටුකරගැනීම තහවුරු කිරීම සඳහා සමස්ථ වැඩසටහන් කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි වැඩසටහනේ වගකීම් නිශ්චය කර මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික පදනම මත මූල්‍ය භෞතික ඉලක්කයන් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වෙතත් වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඉහත සඳහන් තොරතුරු වලට අනුව, වැඩසටහන සඳහා ප්‍රතිපාදනය කර තිබුණු රු:මිලියන 4,309.96 ක මුදලින් රු: මිලියන 156.05 ක් පමණක් 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණු බැවින්, වැඩසටහන ආරම්භ කර වර්ෂ 3 ක කාලයක් අවසානයේදී පවා ප්‍රතිපාදිත මුදලින් සියයට 3.6 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. වැඩසටහන නිමකිරීමට සැලසුම් කර ඇති දින දක්වා ඉතිරිව ඇති කාලසීමාව, වැඩසටහනේ සංරචකයන් සඳහා ප්‍රතිපාදනය කර ඇති සියයට 96.4 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට ප්‍රමාණවත් නොවන බව තවදුරටත් නිරීක්ෂණය විය. සංරචකයන් අනුව අරමුදල් උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තු ගත වියදම් | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | සමුච්චිත වියදම මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| --------------- | ---------------------------------- | | -------------- | ------------- |
| | එ.ජ.ඩො. | රු: | රු: | |
| මෝටර් රථ | 603,302 | 78,881,736 | - | - |
| සිවිල් වැඩ | 3,474,531 | 454,294,928 | - | - |
| උපකරණ හා භාණ්ඩ | 3,290,530 | 430,236,797 | 1,849,634 | 0.43 |
| තාක්ෂණික උපදෙස් හා අධ්‍යයන | 1,446,826 | 189,172,500 | 1,017,409 | 0.53 |
| පුහුණුව හා වැඩමුළු | 3,926,244 | 513,356,403 | 2,273,322 | 0.44 |
| සේවා සැපයුම් කොන්ත්‍රාත් | 3,091,733 | 404,244,090 | - | - |
| ණය | 8,817,363 | 1,152,870,212 | 123,765,785 | 10.73 |
| කොටස් ප්‍රාග්ධනය | 7,125,221 | 931,622,646 | - | - |
| වැටුප් හා දීමනා | 985,661 | 128,875,176 | 25,942,294 | 20.12 |
| මෙහෙයුම් හා නඩත්තු | 201,917 | 26,400,648 | 1,198,605 | 4.54 |
| එකතුව | 32,963,328 | 4,309,955,136 | 156,047,049 | 3.62 |

**5.2.2 භෞතික කාර්යසාධනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ගිවිසුමේ උපලේඛන 1 හි 7.2 (ඊ) වගන්තිය ප්‍රකාරව වැඩසටහන වෙනුවෙන් වාර්ෂික ප්‍රගති වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. වැඩසටහන මගින් ක්‍රියාත්මක කළ කාර්යන්ගේ භෞතික කාර්යසාධන ඇගයීමට ලක්කළ හැකිවන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහනේ කළමනාකරණ ඒකකය විසින් එවැනි වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වැඩසටහනේ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. ලැබුණු තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් එකතුව රු: මිලියන 148.7 ක උප ණය ප්‍රදානය කර තිබුණද මෙයින් රු: මිලියන 113.5 ක් පමණක් වැඩසටහන මඟින් ප්‍රතිමූල්‍යානය කර තිබුණි. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් නියමිත පරිදි අනුගමනය නොකිරීම නිසා ඉතිරි ශේෂය වූ රු: මිලියන 35.2 ක මුදල ප්‍රතිමූල්‍යානය කිරීම වැඩසටහන විසින් අත්හිටුවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) නියම කරන ලද වාර්ෂික පොළී අනුපාතය සියයට 12.25 ක් වුවත්, සියයට 13.25 සිට සියයට 20 දක්වා වෙනස් වූ වාර්ෂික පොළියක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශාඛා මට්ටමින් අයකරන බව නිරීක්ෂණය වුයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ බිම් මට්ටමට ගලා නොයන බව නිරූපණය විය.

(ඈ) සමෘද්ධි බැංකු වැනි ප්‍රමාණවත් තරම් වූ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්කය තුල තිබීම හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සහය දෙන කණ්ඩායම විසින් ක්ෂුද්‍ර මූල්‍ය උපසංරචකය අත්හිටුවා සංරචක 1 හි ඇතුළත් වටිනාකම දාම සංවර්ධනය ( Value Change Development ) සංරචකය සඳහා නැවත වෙන් කිරීමට නිර්දේශ කර තිබුණි. එසේ වුවත් මෙම තත්ත්වය වැඩසටහන සැලසුම් කරන අවස්ථාවේදි හඳුනාගෙන නොතිබුණි.

(ඉ) වැඩසටහන් සැලසුම් වාර්තාවේ 135 ඡේදයට අනුව, ඉදිරි වර්ෂ 15 ක කාලපරිච්ඡේදයක් තුළ ප්‍රතිමූල්‍ය උප ණය ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රීය අරමුදලක් පිහිටවිය යුතුය. මේ නිසා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් රු: 14,627,919 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කර තිබුණු අතර ප්‍රේෂණය කළ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තු ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තැන්පත්ව තිබුණි. තවද, ක්ෂුද්‍ර මූල්‍ය සංරචකය අත්හිටුවීම නිසා වැඩසටහනේ කළමනාකරණ ඒකකය මගින් ප්‍රේෂණය කරන ලද මුදල නැවත වැඩසටහනට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වටිනාකම් දාම සංවර්ධන සහ වෙළඳපල ඒකාබද්ධතා සංරචකයන් සඳහා රු: මිලියන 3,161.54 කට සමාන එ.ජ.ඩො. මිලියන 24.18 ක් වෙන් කර තිබුණද එම සංරචකයන් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ කිසිදු වැඩසටහනක් 2013 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ වැඩසටහනේ ගනුදෙනු පිළිබඳව මුදල් රෙගුලාසි අංක133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) මුදල් රෙගුලාසි අංක 756 ප්‍රකාරව අරමුදලේ වත්කම්වල භෞතික පැවැත්ම සනාථ කර ගැනීම සඳහා වැඩසටහන මඟින් ලී බඩු සහ උපකරණ වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.